# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,215—1960 ඔක්තෝබර් 21 වැනි සිකුරාදා—21.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය-සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 929 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 930 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 931 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 931 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 935 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 447**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය:—

ඒ.62/56.

1960 ඔක්තෝබර මස 1 වැනි දින සිට වී. ඇන්. පිල්ලේ මහතා බන්ධනාගාර කොමසාරිස් වශයෙන්.

ඒ.205/60.

1960 අගෝස්තු මස 11 වැනි දින සිට 1960 සැප්තැම්බර් මස 11 වැනි දින දක්වා සංස්කෘතික කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂ වී. පණ්ඩිත මහතා (සී.සී.ඇස්) ස්වකීය රාජකාරි වලට අතිරේකව රජයේ ලලිත කලායතනයේ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ.113/59.

1960 සැප්තැම්බර් මස 1 වැනි දින සිට ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු ඇස්. බී. සේනානායක මහතා (සී.සී.ඇස්) ස්වදේශීය වෛද්‍ය සංවර්ධන කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

ඒ.147/59.

1959 ජූනි මස 13 වැනි දින සිට වාරිමාර්ග සහකාර අධ්‍යක්ෂ ට්. බී. ට්. සෙනවිරත්න මහතා වාරිමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ වශයෙන්.

ඒ304/60.

1960 සැප්තැම්බර් මස 28 වැනි දින සිට ඩී. ඇම්. පී. බී. දසනායක මහතා (සී.සී.ඇස්) ආපසු එන තුරු හෝ නැවත නියමයක් කරන තුරු මහා භාණ්ඩාගාරයේ සැපයීම සහ සේවක සංඛ්‍යා සහකාර පාලක ඒ. ආර්. ඇම්. ජයවර්ධන මහතා (සී.සී.ඇස්) ස්වකීය රාජකාරී වලට අතිරේකව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒ.315/60.

1960 සැප්තැම්බර් මස 27 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩබ්ලිව්. ට්. ජයසිංහ මහතා (සී.සී.ඇස්.) ස්වකීය රාජකාරිවලට අතිරේකව කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන වශයෙන් වැඩ බැලීමට.

ඒ.192/60.

1960 සැප්තැම්බර් මස 3 වැනි දින සිට හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. පත්මනාදන් මහතා (සී.සී.ඇස්) මහා භාණ්ඩාගාරයේ අතිරේක ආයතන පාලක තනතුරේ රාජකාරී කටයුතු කිරීමට.

ඒ.333/59.

1960 ජූනි මස 20 වැනි දින සිට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරුවන් වන ජේ. ජී. ඇස්. පෙරේරා සහ එච්. ඇෆ්. දෙල්ගොඩ යන මහත්වරු සහ ඇම්. ට්. ඇෆ්. ගුණවර්ධන තෝනාමහත්මිය එම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුවන් වශයෙන්.

ඒ.333/59.

1960 ජූනි මස 20 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර තක්සේරුකරු බී. මහින්ද මහතා තක්සේරුකරු තනතුරකට අයත් රාජකාරිවල කටයුතු කිරීමට.

ට්. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ 1, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ. පෙ. 500.

10—573

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 448**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය:—

අංකය : ජේඒ. 18/48.

සී. ඊ. ජයවර්ධන මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1960 ඔක්තෝබර් 17 වැනි දින සිට, ගාල්ලේ දිස්ත්‍රික් උසාවියේ අංක 16,311 නඩුව අවසාන වන තුරු ඇසීමට හා තීන්දුව දීමට, ගාල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑස්සී. පීපී. 7/60.

ඩී. විමලරත්න මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. කේ. කන්දසාමි මහතා 1960 ඔක්තෝබර් 10 වැනි දින සිට 29 වැනි දින දක්වා, කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ, කුරුණෑගල අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා අතිරේක මහේස්ත්‍රාත් ධුරයේ, හා කුරුණෑගල අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඳලාගම මහතා 1960 ඔක්තෝබර් 8 වැනි දින, කෑගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 3ඒ/59.

ඒ. එම්. අමීන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. වී. එස්. ද සිල්වා මහතා 1960 ඔක්තෝබර් 9 වැනි හා 10 වැනි දිනයන්හි, කුරුණෑගල, කනදුල්ල පිහිටි උසාවියේ (කුලියාපිටියේ නගර සභාව සීමාව තුළ පිහිටි) අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කුරුණෑගල, කනදුල්ල පිහිටි උසාවියේ (කුලියාපිටියේ නගර සභාව සීමාව තුළ පිහිටි) අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 65/48 (iv).

පී. ශ්‍රී. ස්කන්ද රාජා මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, සී. සී. සෝමසේගරම් මහතා 1960 ඔක්තෝබර් 10 වැනි දින සිට, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, යාපනේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා යාපනේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 53ඒ/58.

කේ. ඒ. පී. රණසිංහ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. ආසිර්වාතම් මහතා 1960 ඔක්තෝබර් 8 වැනි දින, රත්නපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 49ඒ/53/27ඒ/2/57.

එම්. පී. සී. රත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ඔක්තෝබර් 6 වැනි හා 7 වැනි දිනයන්හි, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා එම්. ඒ. එම්. හුසේන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ඔක්තෝබර් 12 වැනි දින සිට 14 වැනි දින දක්වා, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 41ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා 1960 ඔක්තෝබර් 10 වැනි දින සිට, නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, හා 1960 ඔක්තෝබර් 25 වැනි දින සිට නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 6/48.

ඒ. ඊ. ආර්. කොරෙයා සහ ජී. සී. නයිල්ස් යන මහතුන් නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඊ. පී. විජේතුංග මහතා 1960 ඔක්තෝබර් 22 වැනි දින, මාතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, මාතර අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 2ඒ/56.

ඩී. එස්. එල්. පී. අබේසේකර මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ආර්. ද අල්විස් මහතා 1960 ඔක්තෝබර් 13 වැනි දින, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බතෝලමියුස් මහතා 1960 ඔක්තෝබර් 11 වැනි දින, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහේස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහේස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 57/48.

සී. වී. උඳලාගම මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1960 ඔක්තෝබර් 17 වැනි දින, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ඔක්තෝබර් 11 වැනි දින සිට, කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ අංක 38,888/ඒ නඩුවේ තීන්දුව දීමට, කොළඹ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට, හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67/48.

එස්. තම්බිදුරේ මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 ඔක්තෝබර් 18 වැනි දින සිට 25 වැනි දින දක්වා, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මඩකලපුවේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පරනාදන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1960 ඔක්තෝබර් 24 වැනි හා 26 වැනි දිනයන්හි, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කඩ්ඩුකුලම් හා තම්පලකාමම්පත්තු ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/යු. 1/48.

ජී. එම්. උඳලාගම මහතා නැති අතර, ආර්. පමුනුව මහතා 1960 ඔක්තෝබර් 13 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ දකුණු හා නැගෙනහිර මාතලේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. ඒ. සී. එම්. මීරා සයිබො මහතා 1960 ඔක්තෝබර් 18 වැනි දින, මඩකලපු දිස්ත්‍රික්කයේ කරවාකු, නින්තාවූර්, සමන්තුරේ හා වැව්ගම් පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එච්. එස්. අගලවත්ත මහතා 1960 ඔක්තෝබර් 12 වැනි හා 13 වැනි දිනයන්හි, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරලයන්හි හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් 12 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

10—519

# වෙනත් පත් කිරීම්

## 1960 අංක 451

අංකය : ඒ. ජේ. 2/48/55.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍ය වරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

ජේ. ආර්. මචාඩෝ මහතා කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චය කරුවකු වශයෙන්

පත් කර ඇත්තේ ය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡෙදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 සැප්තැම්බර් මස 28 වෙනි දින ගාලු දිස්ත්‍රික්කයේ හිනිදුම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට පියසේන නාගොඩ විතාන මහතා

පත් කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1960, ඔක්තෝබර් මස 15 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.
10—561

---

## 1960 අංක 452

ෆ්‍රැන්සිස් ෂේවියර් ජේකබ් මුත්තයියා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් පත් කර තිබේ.

ඇල්. ඇස්. බී. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දීය.
10—375

---

## 1960 අංක 453

අංකය : ඊබී/ඒ./204/2.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිචෙඡදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඩ කරණ ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි සථිර ලේකම් විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ :—

කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩබ්ලිව්. ටී. ජයසිංහ මහතා, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන වශයෙන් වැඩ බලන කාලය තුළ, සවකීය රාජකාරි වලට අතිරේක වශයෙන් 1960 සැප්තැම්බර් මස 27 වෙනි දින සිට, නැවත නියමයක් කරන තුරු, වයඹ පළාතේ පිස්කල්.

ඩී. සී. ඇල්. අමරසිංහ,
සථිර ලේකම් වෙනුවට.

1960. 10. 12 දින,
කොළඹ,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.
10—474

---

## 1960 අංක 454

මගේ අංකය : ඊබී/ඒ - 258.

කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු භාර ගරු ඇමති තුමා පහත සඳහන් පත්වීම කිරීමට සතුටු වී ඇත :—

කෑගල්ල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන්පත් ඩබ්ලිව්. ටී. ජයසිංහ මහතා, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැන වශයෙන්, වැඩබලන කාලය තුළ, සවකීය රාජකාරි වලට අතිරේක වශයෙන්, 1960 සැප්තැම්බර් මස 27 වෙනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පැට්‍රොල් ආඥාපනත යටතේ ප්‍රාදේශීය අධිකාරී.

ඇල්. ඇස්. බී. පෙරේරා.
සථිර ලේකම්.

1960. 10. 12.
කොළඹ 7,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.
10-475

---

## 1960 අංක 455

### ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත

### (115 වන පරිචෙඡදය)

වර්ෂ 1947 ලංකා (ස්වාධීනතා) රාජ්‍ය සභා ආඥාවේ 8 වන වගන්තිය යටතේ පනවනු ලැබ වර්ෂ 1948 පෙබරවාරි මස 5 වන දින අංක 9,828 දරණ ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ප්‍රකාශයෙන් මඳ වශයෙන් සංශොධනය කරනු ලැබූ ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීම පිළිබඳ ආඥාපනතේ (115 වන පරිචෙඡදය) 3 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතු සේවා ඇමති තුමන් විසින් හැටන්හි ගෘහ සේවකයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තැන වශයෙන්, ආර්. ගුණනායගම් මහතා වෙනුවට වර්ෂ 1960.10.3 වෙනි දින සිට, විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ ලිපිකරු තැන්පත් ආර්. ජෝශප් මහතා පත් කරන දී.

සී. බී. කුමාරසිංහ,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
අතිරේක ස්ථිර ලේකම්.

1960 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ දීය.
10—427

---

## 1960 අංක 456

1960 ඔක්තෝබර් 1 වෙනි දින සිට, විධායක ලිපිකාර 1 වෙනි ශ්‍රේණියේ නිලධාරි තැන්පත්, ටෝගෝ ඇඩ්වින් පීරිස් ගුණතිලක මහතා රජයේ ලේඛන භාරකාර තැන මෙන් පත් කර ඇති බැව්, මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

අ. දේවරාජ්,
වැ. බ. රාජ්‍ය ලේඛනාරක්ෂක.

1960 ඔක්තෝබර් 4 වෙනි දින,
නුවරඑළියේ රාජ්‍ය ලේඛනාගාරයේ දීය.
10—501

---

# ආණ්ඩුවේ නිවේදන

## දැන්වීමයි

නාංගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් ආනන්ද අතපත්තු මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් අවසර දී තිබේ.

ඇල් ඇස්. බී. පෙරේර,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ දීය.
10—373

---

## දැන්වීමයි

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රිසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් පතිරණගේ ආතර් ඩයස් සමරසේකර මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ

ඇල්. ඇස්. බී. පෙරේර,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ඔක්තෝබර මස 5 වැනි දින,
කොළඹ දීය.
10—374

අංක : ඇල්. ඞී.—බී. 11/48.

## 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥපනත

### නිවේදනයයි

වර්ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥපනතේ 20 සහ 24 යන වගන්තිවලින් ලැබී ඇති බලය පිට මීට යාව ඇති උපලේඛන යෙහි දක්වෙන තීරණයක් ඇති කිරීමට තමන් අදහස් කරන බව කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව වර්ෂ 1943 අංක 40 දරන ආඥපනතින් සහ වර්ෂ 1953 අංක 5 දරන පනතින් සංශොධිත එකී ආඥපනතේ 26 A වගන්තියේ විධි විධාන අනුව මෙයින් නිවේදනය කරයි.

මේ යෝජනාවට විරුද්ධව කීමට ඇති කරුණු කල්පනා කර බැලීම සඳහා වර්ෂ 1960 නොවැම්බර් මස 15 වන දින දවල් 12 දක්වා පඩි සභාවේ සභාපති මහතා විසින් භාර ගන්නවා ඇත.

සෑම විරුද්ධත්වයක් එසේ විරුද්ධවීමට හේතු භූත වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිත ලියවිල්ලකින් කළ යුතු ය.

සී. බී. කුමාරසිංහ,
කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි
පාලක සභාවේ සභාපති.

1960 ඔක්තෝබර් මස 12 වන දින,
කොළඹ දීය.

## උපලේඛනය

### I වන කොටස

වැඩ කරන සාමාන්‍ය දවසක් පිළිබඳ අර්ථ නිරූපනය (24 වන වගන්තිය).

මෙහි III වන කොටසෙහි නියමිත කම්කරුවන්ට අදාළ වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණන (කෑම වේලකට පැයක් ඇතුළුව) නවයක් විය යුතු ය.

### II වන කොටස

කෑලි මිම්මේ වැඩ සඳහා අඩුම වේතන ප්‍රමාණය

කුරුඳු තැලීමෙහි (පඳුරුවලින් කුරුඳු ගස් කැපීම, කෝටු කැපීම සහ තලන වාඩියට ගෙන යාම, පොත්තේ පිට සීවිය සීරීම, කෝටු තැලීම හෙවත් පොතු ගැලවීම, පොතු කුරුවලට හැරවීම හා කුරු ඇගිරීම සහ මිටි බැඳීම ඇතුළුවයි) යෙදී සිටින කම්කරුවන්ට කෑලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය නැලූ කුරුඳු රාත්තලකට සත 75ක් විය යුතු ය.

### III වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා අඩුම වේතන ප්‍රමාණය

I වන තීරයෙහි නියමිත කම්කරුවන්ට කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය 2 වන තීරයේ දක්වා ඇති අනුරූප ප්‍රමාණයන් විය යුතු ය.

| 1 වන තීරය<br>කම්කරුවන්ගේ පන්තිය | 2 වන තීරය<br>ප්‍රමාණය |
|---|---|
| පහත සඳහන් වැඩවල නියුක්ත කම්කරුවෝ— | |
| තුහුරු පෑහීම ... | වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට රු. 3.50 යි. |
| කාණු දැමීම සහ තට්ටු සකස් කිරීම | වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට රු. 3.00 යි. |
| වල් නෙලීම, ඉලුක් තණ ඉවත් කිරීම සහ මායිම් එළි කිරීම : | |
| (අ) පිරිමි කම්කරුවකුට ... | වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට රු. 2.50 යි. |
| (ආ) කම්කරු ස්ත්‍රියකට ... | වැඩ කරන එක් එක් සාමාන්‍ය දවසකට රු. 2.00 යි. |

### IV වන කොටස

වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණනට වැඩියෙන් වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අඩුම අතිකාල වැටුප් ප්‍රමාණය, (අඩුම දෛනික වේතන ප්‍රමාණය 8න් බෙදා සොයා ගත යුතු) පැය කට ගෙවෙන අඩුම වේතනය ඉන් සියයට 50 කින් වැඩි කළ විට ලැබෙන ප්‍රමාණය විය යුතු ය.

10-483

## 1952 කේ අංක 25 සහ 1956 යේ අංක 30 දරණ පනත් වලින් සංශොධිත 1940 අංක 24 දරණ ධීවර ආඥපනතේ 18ඒ වගන්තිය යටතේ කරන නිවේදනයයි

ගාලු දිස්ත්‍රික්කයේ තෙල්වත්ත වරාය තුළ මාදැල් වටකිරීම සම්බන්ධයෙන් එක්තරා පුද්ගලයන් කණ්ඩායම් අතර පැන නැගී ඇති ආරාවුල පිළිබඳ වග විභාගකර බැලීමට පත්කරන ලද සමථයට පමුණුවන නිළධාරි තැනගේ වාර්තාව මහජනයාගේ දැනගැනීම පිණිස පහත පළවේ.

මෙම ධීවර අරගලයෙන් හිරිහැරයට පත් කෙනෙක් හෝ මීට සම්බන්ධවන යමකින් හෝ ඊට හේතුවන යමකින් හිරිහැරයට පත් වූවෙක් හෝ මේ වාර්තාවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට කැමතිවේ නම්, මේ නිවේදනය පළවන දිනයේ සිට මාසයක් ඇතුත් වන්නට පෙර ලියවිලි මාගීයෙන් ඒවා කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ගරු ඇමතිතුමා වෙත ලැබෙන්නට සැළැස්විය යුතුයි.

ඞී. ජේ. එල්. මීසෝ,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල අමාත්‍යාංශයේ
ස්ථාවර ලේකම් වෙනුවට.

1960 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

1960 අගෝස්තු 23 වැනි දින,
හික්කඩුවේ තානායමේදීය.

පස්වරු 5.30 ට

## තෙල්වත්ත වරාය ධීවර ආරාවුල

### නියෝගය

1952 අංක 25 සහ 1956 අංක 30 දරන ධීවර (සංශෝධන) පනත් වලින් සංශෝධිත 1940 අංක 24 දරන ධීවර ආඥපනතේ 18 ඒ වගන්තියේ 1 වැනි උප වගන්තිය ප්‍රකාර, ගාලු දිස්ත්‍රික්කයේ තෙල්වත්ත වරාය තුළ මාදැල් වට කිරීම සම්බන්ධයෙන් එක්තරා පුද්ගලයන් කණ්ඩායම් අතර පැනනැගී ඇති ආරාවුල් සමථයකට පමුණුවීමට, ගරු කර්මාන්ත හා ධීවර ඇමති තුමන් විසින් මා වෙත බලය පවරා ඇත.

ගරු ඇමතිතුමාගේ 1960 ජනවාරි 18 වැනි දින දරන මැන්ඩේට් බල පත්‍රය පරිදි එම ආරාවුල්වලට අඩංගු කරුණු මෙසේ ය :—

(1) තෙල්වත්ත වරාය තුළ මාදැල් වටකිරීමේ වාරයන් බෙදා දීම සඳහා මාදැල් දනට ලියා පදිංචි කරනු ලබන්නේ ගාලු දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති විසිනි. අවුරුදු කිහිපයක් තිස්සේම තෙල්වත්තේ ඒ. අන්දෝරිස් සිල්වා ඒ. ගීදිරික් සිල්වා, එන්. එච්. අයනෝරිස් සිල්වා, ඒ. බාරොන් සිල්වා, අන්තොනි ආරොන් සිල්වා, ඒ. මත්තෙ සිංඤ්ඤෝ සහ එල්. දීසොන් සිල්වා යන අයට පමණක් තෙල්වත්ත වරාය තුළ මාදැල් වටකිරීමේ වාරයන් දී තිබේ. තෙල්වත්තේ පැරැළිය මස් මරන්නන්ගේ සමූපකාර ණය ගනුදෙනු හා වෙළඳ සමිතිය සංවිධානය කළ මස් මරන්නන් කණ්ඩායමක් ඔවුනටද තෙල්වත්ත වරාය තුළ මාදැල් වටකිරීමේ වාරයන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිති. තෙල්වත්ත වරායේ මාදැල් වටකිරීමේ වාරයන් ලබා ඇති සමහරෙක්, මෙම සමිතියට මස් මැරීමේ කිසිම වාරයක් දීම ගැන විරුද්ධ වෙති.

(2) තවද, මාදැල් වට කිරීමට තමනට ලැබී ඇති වාර සම්බන්ධ යෙන්, තෙල්වත්තේ ඒ. ගීදිරීස් සිල්වා සහ තෙල්වත්තේ ඒ. අන්දෝරිස් සිල්වා අතරත්, තෙල්වත්තේ එල්. දීසොන් සිල්වා සහ තෙල්වත්තේ එන්. එච්. අයනෝරිස් සිල්වා අතරත් ආරාවුලක් පැන නැග ඇත.

(3) තෙල්වත්ත වරායේ මාදැල් වටකිරීමට තමාටද අවසර දෙන ලෙස තෙල්වත්තේ විල්බට් පියදාස විසින් ඉල්ලුම්කර තිබේ.

තවද, මේ ආරාවුල්වලට අඩංගු කරුණු පමණක් නොව, එයට සම්බන්ධවූත්, අදාලවූත් නැතහොත් එයින් පැන නගින්නාවූත් කරුණු මෙම වගන්තියෙන් ඉඩ ඇති පරිදි ඉදිරිපත් කරන ලද කරුණු සැලකර සිටීමකින් ප්‍රකාශ වේනම්, ඒ සම්බන්ධව ප්‍රසිද්ධ විභාගයක් පැවැත්වීමට හා රපෝර්තු කිරීමටත් මට පවරා තිබේ. ධීවර ආඥ පණතේ 18 ඒ වගන්තියේ 3 වැනි උප වගන්තිය ප්‍රකාර මවිසින් පවත්වනු ලබන ප්‍රසිද්ධ විභාගය සම්බන්ධ නිසි පරිදි ප්‍රසිද්ධ කිරී මෙන් පසු, එම 18 ඒ වගන්තිය අනුගමනය කරමින් මවිසින් 1960 මැයි 28 වැනි දින ආරම්භ කොට තවත් දින හතරක් මුළුල්ලේ හික් කඩුවේ තානායමේදී ප්‍රසිද්ධ විභාගයක් පවත්වන ලදී. එහිදී, 18 ඒ වගන්තියේ 4 වැනි උප වගන්තියෙන් ඉඩ ඇති පරිදි මා වෙත හෝ ධීවර අධ්‍යක්ෂක වෙත හෝ ලියවිලි මගින් ඉදිරිපත් කරන ලද කරුණුත් තවත් විභාගයේදී සාක්ෂි මගින් ඉදිරිපත් කරන ලද කරුණුත්, යන මේ හැම කරුණක්ම මගේ සැලකිල්ලට භාජනය කරන ලදී. ඉහත සඳහන් වූ හැම විභාග දිනකම, ආරාවුලට සම්බන්ධ හැම පක්ෂයක් වෙනුවෙන්ම වාගේ නීතිඥයෝ පෙණී සිටියහ. එම නීතිඥ යින් ගෙන් මට ලැබුණු ආධාර ඉතා අගනේ ය. ඒ අය නො සිටියේ

නම් මේ විභාගය නුවුවමනා පරිදි දිග් ගැසෙන්නට ඉඩ තිබිණි. එහෙයින්, මම මෙහිදී මගේ ඉමහත් කෘතඥතාවය මේ මහතුන් වෙත පිරිනමමි.

සමාලෝචනයට භාජනය වී ඇති මාදැල් වට කරන ධීවර වරාය තෙල්වත්ත වරාය නමින් ප්‍රසිද්ධ ව ඇති මුත් එය, තෙල්වත්ත පැරැළිය යන යාබද ගම් දෙකෙහිම වෙරළ අද්දර තෙක් විහිදී ඇත. පට බැඳි ආරච්චි සහ ආදායම් පාලක නිලධාරි විසින් ඉදිරිපත් කරන ලද සංඛ්‍යාලේඛණ අනුව, තෙල්වත්තේ හා පැරැළිය මස් මරණ වැඩිහිටි පිරිමි සංඛ්‍යාව මෙසේය. තෙල්වත්තේ 74 දෙනෙක් සහ පැරැළියේ 111 දෙනෙක් ය.

මෙම වරායෙහි තුන් වර්ගයක මාදැල් පාවිච්චි වේ. නම් වශයෙන් ඒ මෙසේය :—

(1) නූල් දැල් :—ඉතා කුඩා දැල් ඇස් වලින් යුත් මේ දැල් වර්ගය සාදා ඇත්තේ හණ නූලෙනි. එය අති විශාල, පහසුවෙන් ක්‍රියා කරවිය නොහැකි, එකක් රු. 20,000 ක් පමණ වටිනා දැල් විශේෂයකි. තෝරා, පරවා පටන් කුඩා හාල් මැස්සා දක්වා ඇති හැම වර්ගයකම මාළුන් අසුවෙන මේ දැලෙන් කිසිම මාලුවකුට ගැලවී යා නොහැක.

(2) ලනු දැල් :—කොහුලනුවලින් වියන ලද මේ දැලක් රු. 2,000 පමණ මිළ වේ. පරවි වැනි වේගයෙන් පිහිනා යන මාළු රැනක් වට කිරීමට නූල් දැලක් පහසුවෙන් ක්‍රියා කරවිය නො හැකි නිසා, නූල් දැලට අනුබද්ධව මේ දැලද පාවිච්චි වේ.

(3) කපු දැල් :—නූල් දැලක් මෙන් සාදා ඇති එහෙත් එයට වඩා කුඩා මෙම දැලක් රු. 3,000 සිට රු. 5,000 තෙක් මිළ වේ. නූල් දැලකින් වට කරන ලද මාළු රැන් පසුපස එන මාළුන් ඇල්ලීමට මෙය පාවිච්චි කරති.

මේ හැම දැලකටම ඒවා ගෙන ගිය හැකි ඔරුවක් ද විය යුතුයි. එම ඔරුවත් එයට අයිති අනිකුත් පනනත් සමග රු. 1,000 සිට රු. 2,000 තෙක් මිළ වේ. නූල් දැලක් මිළයට ගැනීමට තරම් වත්කමක් නැති විට මෙහි මස් මරන්නන්, එයට වඩා අඩුවෙන් ගත හැකි කපු දැල් පාවිච්චි කරති. නූල් දැලකින් මෙන් කපු දැලකින් හොඳාකාර මසුන් ඇල්ලීමට නො හැකි බවට කිසිම සැකයක් නොමැත.

දැල්වලින් අල්ලාගත හැකි විශාලම මසුන්, මෙම වරායෙහි අසුවෙන අවස්ථා එමටය. එහෙත්, මෙහි දැල් හිමියන් වැඩි ආදායමක් ලබනු පෙනෙන්නේ වරායේ දී විශාල වශයෙන් අල්ලා ගත හැකි හාල් මැස්සන් සහ අනිකුත් කුඩා මසුන් රැන්වලිනි.

මෙම වරායෙහි මාදැල් වටකිරීමේ යටගියාව සඳහා 1950 වර්ෂයෙන් එහා බැලීම නුවුවමනාය. 1950 දී කර්මාන්ත, කර්මාන්ත පයෙෂණ හා ධීවර ඇමති තුමන්ගේ එවකට පාර්ලිමේන්තු ලේකම්ව සිටි එච්. ද ඉසැඩ් සිරිවර්ධන මහතා විසින් විභාගයක් පවත්වන ලදී. එහිදී, හැම පක්ෂයක් විසින්ම එකඟවූ ක්‍රම සංවිධානයක් පිළියෙළ විනි. ඒ අනුව පහත සඳහන් කණ්ඩායම් 3 ට මාළු ඇල්ලීමට එක කණ්ඩායමට වාර පහ බැගින් ලැබිණි. 1958 වනතුරු මේ ක්‍රමය නො කඩවා අනුගමනය කොට ඇත. එහෙත් 1958 වර්ෂයේදී ඇතිවුණු සිද්ධීන් සමූහයක් නිසා, ඒ දිනවලම සංවිධානය වූ තෙල්වත්ත පැරැළිය මසුන් මරන්නන්ගේ සංගමය නමින් යුත්, (මින් පසු "සංගමය" නමින් හැඳින් වේ), සමිතියකට මසුන් මැරීමේ වාර 3ක් දීමට සිදු විය. එමනිසා, මෙතුවක් කල් පැවත ආ 15ස් දවසේ චක්‍රය වෙනස් වී 18 දවසේ චක්‍රයක් ඇතිවිණි.

ඉහතින් සඳහන් වූ කණ්ඩායම් 3 නම් :—

එල්. දීසොන් සහ නල්ලහන්දි අයනෝරිස්, එල්. දීසොන්ට වාර 3ක්ද, අයනෝරිස්ට වාර 2ක්ද ලැබිණි. මේ දෙදෙන කිට්ටු වර ඥාතින්ය. මසුන් මැරීමේ 15ස් දවසේ චක්‍රයෙන් ඔවුන් දෙදෙනාට දින 5ක් ලැබුණි.

දෙවැනි කණ්ඩායම, අන්තොනි බාරොන්, අන්තොනි මත්තො සිංඤෝ සහ අන්තොනි ආරොන් යන ඥාති සොහොවුරන් තිදෙනාගෙන් සමන්විත විය. මේ කණ්ඩායමටද දින 5ක් ලැබිණි. ඒ දින 5 නැවත මෙසේ බෙදිණි. බාරොන්ට දින 3යි, මත්තො සිංඤෝට සහ ආරොන්ට දිනය බැගින්, අන්තිම කණ්ඩායමේ වූයේ, සොහොවුරන් දෙදෙනකු වූ අන්තොනි අන්දෝරිස් සහ අන්තොනි ශීදිරික්ය. සිරිවර්ධන නියෝගය අනුව, මේ දෙදෙනාගෙන් අන්දෝරිස්ට දින 4ක්ද, ශීදිරික්ට එක් දිනයක්ද ලැබිණි.

මෙම විභාගයේදී, ඉහත සඳහන් වූ සංගමය සමුපකාර ධීවර සමිතියක් ලෙස ලියා පදිංචි වූවත්, එය ඇත්ත වශයෙන්ම එල්. දීසොන්ගේ උද්‍යෝගයේ ප්‍රතිඵලය නිසා ඇති වූවක් බව, නීතිඥයන් විසින් පෙනී සිටිනු ලැබූ හැම පක්ෂයක්ම වාගේ තහවුරු කර සිටියේය. එම සංගමය වූ කලී දීසොන්ගේ ක්‍රියාශීලීත්වයේ අතිරේකයක් පමණි. ඔහු යටතේ සිටින මිනිසුන්ගෙන් බොහෝ දෙනකු මෙම සංගමයේ සාමාජිකයන්ය. මේ හැම ප්‍රකාශයක්ම යුක්ති සහගත යැයි සිතීමට ඉඩ ඇත. මක්නිසාද යත්, මේ සංගමයේ, "මන්ඩාඩි" බැස්චියන් දීසොන්ගේත් මන්ඩාඩිය නූල් දැලක් පාවිච්චි කිරීමට මේ සංගමයට යම් අවස්ථාවක් ඇති වූයේ නම් ඒ හැමවිටම දීසොන්ගේ නූල් දැල සංගමය විසින් පාවිච්චි කොට ඇත.

මෙම සංගමයට කිසිම නූල්දැලක් නැත. මෙම සංගමයටම අයිති දැල් කිසිවක් නැතැයි කුලරත්න මහතා විසින් තහවුරු කළ කල්හි, සංගමය විසින්, සංගමයේ දැල් යයි මට පෙන්වන ලද දැල් කුඩා, බාල වර්ගයක දැල්ය. මෙම සංගමය සමුපකාර ධීවර සමිතියක් ලෙස ලියා පදිංචි කරවා ගැනීමෙන් දීසොන් නූල් දැල් හිමි අනිකුත් කණ්ඩායම් දෙකට හොරා ලාභයක් ලබා ඇතත් නැතත්, එසේ කිරීමෙන් ඔහු අදාෂ්‍යමාන ප්‍රයෝජන ලබා ඇති වුවත්, මෙම සංගමයට වාර 3ක් දීමෙන් පසු, සංගමය විසින් මෙතුවක් කල් විඳි අයිතිවාසිකම් පැහැර ගැනීම අයුතු සහගතය. එහෙයින් මගේ නිර්දේශය නම් මෙම සංගමයට අයිති වාර තුන දැනටත් එසේ ලැබෙන්නට ඉඩ හැරීමයි. එහෙත්, 1962 ඔක්තෝබර් මාසයෙන් පසු 18 දවසේ මසුන් මැරීමේ චක්‍රයෙන් දින 3ක් භුක්ති විඳීමේ අයිතිවාසිකම තබා ගන්නට නම් මෙම සංගමය 1962 දැල් හා ඔරු ලියා පදිංචි කිරීමේ වකවානුවේදී, දැනට අයිති දැල්වලට වඩා හොඳ කපුදැල් හා නූල් දැලකුත් සංගමයේ උපකරණ වශයෙන් ලබාගත යුතුය. මෙ වූකලී ලියා පදිංචි කිරීම භාර නිලධාරි තැන සතු කටයුත්තකි. මෙහි ලියා පදිංචි කිරීම භාර නිලධාරි තැන නම් ගාල්ලේ ආණ්ඩුවේ දිසාපතිය.

මින්පසු "සමිතිය" නමින් හැඳින්වෙන, තෙල්වත්ත පැරැළිය මසුන් මරන්නන්ගේ සමුපකාර ණය ගණුදෙණු සහ වෙළඳ සමිතියයි කියා ගන්නා සමිතියේ ඉල්ලීම් ගැන සඳහන් කිරීමට ඇත්තේ ඒ වූකලී, සංගමය මෙම වරායෙහි වාර 3ක් මසුන් මැරීමට කිසිදු අපහසුවක් නොමැතිව ලබාගත් අන්දම දැක එයින් දිරිමත් වූ කිසියම් ගවේෂකයන් සමූහයක් විසින් තමන්ටත් එවැනිම ලාභ ප්‍රයෝජනයක් ලබා ගැනීමට කළ උපක්‍රමයක් බවය. මෙම විභාගය පවත්වන්නට යන බව පතළ වූවායින් පසු, 1960 මැයි 13 වැනි දායින් ආරම්භ කොට ඉන් පසු දින 3ක් පිළිබඳව පරීක්ෂණ සටහන් (සී 4) යයි සම්මත යම් කිසි දැයක් එකම දිනයෙහිම පොතක සටහන් කිරීමත්, රුපියල් 200ක් බැංකුවක තැන්පත් කිරීමත් හැර අන් කිසිම දෙයක් මෙම සමිතිය විසින් කර නොමැත. එම රුපියල් 200 න් රු. 100 ක් දැනටමත් ආපසු ඇරගෙන ඇත. එස්. එම්. එච්. සිල්වා මහතා මේ සමිතිය වෙනුවෙන් පෙනී සිටියේය. තත් නිලධාරීන් නො මග යවා, දීසොන්ගේ අනුග්‍රහය ලත් සංගමය, එම සංගමයට මසුන් මැරීමේ වාර 3 ක් ලබා ගත්තාට මාව මුලාකොට එම වැරැද්දම නැවත කිරීමට මේ සමිතියට ඉඩ දිය යුතු නොවේ. මේ වරායේ මසුන් මැරීමේ කිසිම වාරයක් සමිතියට නොදෙමි. මගේ නියෝගය සඳහා විභාගයෙහි අන්තිම දිනයෙහි, එය කල් තැබූවාට පසු, දැල් සහ නොහොත් ඔරු කිහිපයක් මිළයට ගත් බව දන්වා සමිතියෙන් ලිපියක් මම ලදිමි. එහෙත් එයින් කිසිදු පලක් නැත. මේ ලිපියෙහි සඳහන් වී ඇති දෑ අත්තක් ද නැත්තක් ද දැන ගැනීමට මට කාලයක් නොමැත. තවද, මේ විභාගයට සහභාගි වූ අනිකුත් පක්ෂවලටත් එම ප්‍රකාශයේ සත්‍යාසත්‍ය තාවය මැන ගැනීමට කිසිම අවස්ථාවක් ලැබී නැත.

කිසිදු සැකයක් නොමැතිව, යාබද ගම් දෙකක් වූ තෙල්වත්තෙහි සහ පැරැළියෙහි ආදී මසුන් මරන්නන්ගේ සංඛ්‍යාව මේ යටගිය අවුරුදු දහය තුළ ශීඝ්‍ර ලෙස වැඩිවී ඇත. එහෙත් ඔවුන් හමුවේ ඇති ධීවර වරායත්, එයින් අල්වා ගත හැකි මාළු ප්‍රමාණයත් පෙර තත්ත්වයේම පවතී. එහෙයින්, මෙම වරාය තුළ මසුන් මැරීමේ අයිතිවාසිකම් ඉල්ලා සිටින හැම නවකයකුටම එම අයිතිය දුනහොත්, මෙපමණ කල් මේ වරාය තුළ මසුන් මැරීමේ යෙදී සිටින ආදී කාලීනයනට එයින් වනුයේ බලවත් අකටයුත්තකි. එසේ ඉඩ දුනහොත් නූල් දැල් හිමියනට එම දැල් යථා තත්ත්වයෙන් තබාගෙන සිටීමට යන විය හියදම් නිකරුනෝය. මෙයට ඇති එකම ප්‍රතිකර්මය රඳා ඇත්තේ අයිතිවාසිකම් ඉල්ලා සිටින නවකයන් වෙතමය. වරායෙන් පිටත ගැඹුරු මුහුද කාටත් පොදු ලෙස ඇත. කිසිම අවහිරයක් නොමැතිව දිනපතා වුවද දියඹට ගොස් මසුන් මැරිමට හැකි දියඹ ඔරු හා පන්න ලබා ගැනීමට වියදම් වනුයේ ඉතා සුලු මුදලකි. කිසිම මාදැලක වැඩ නොකරන මෙහි සිටින මසුන් මරන්නන් වැඩි වැඩියෙන් දියඹ මසුන් මැරීමට පුරුදුවිය යුතුය. මාදැල්වල වැඩ කරන මසුන් මරන්නන් වුවද ඔවුන් මාදැල් වට නොකරන විවේක දිනයන්හිදී දියඹ මසුන් මැරීමට නොගොස් සිටීමට කිසිම හේතුවක් නොමැත.

සොහොවුරන් දෙදෙනකු වන තෙල්වත්තේ ඒ. ශීදිරික් සිල්වා සහ තෙල්වත්තේ ඒ. අන්දෝරිස් සිල්වා අතර ඇති ආරාවුල මෙසේය. සිරිවර්ධන නියෝගයෙන් පසු එම නියෝගයට විරුද්ධව ඇපැල් ගැනීමට ශීදිරික් සිල්වාට වුවමනා විය. එහෙත් ජී. 2 දරන ලියවිල්ල ප්‍රකාර ඔහුගේ සොහොයුරු අන්තෝනි අන්දෝරිස් සහ අන්දෝරිස් යටතේ වැඩ කරන්නනුත් එකතුවී මසුන් මැරීමට ඔවුන් ලත් වාර 5හෙන් වාර 3ක් අන්දෝරිස් ලබාගෙන, ශීදිරික්ට ඉතිරි වාර 2 දීමට කැමති වීමෙන් ඔහු අස්වසාලීහ. කුමන අන්දමේ හෝ නඩුහබ මේ සොහොයුරන් දෙදෙනා අතර තිබුනත්, මේ නියෝගය ඒවා කෙරෙහි බලපාන්නේ නැතිනම්, මේ නිරවුල් කිරීමට එකඟ නොවීමට ඔවුනට කිසිම හේතුවක් නොමැත. එහෙයින් මගේ තීන්දුව නම්, ඔවුන් දෙදෙනාට ලැබී ඇති වාර 5න් අන්තෝනි අන්දෝරිස්ට වාර 3ක් දීමත් ඔහුගේ සොහොයුරු ශීදිරික්ට වාර 2ක් දීමත් ය.

සිරිවර්ධන නියෝගය අනුව දීසොන් හා එන්. එච්. අයනෝරිස් ලත් වාර 5න් දීසොන්ට වාර 3ක්ද අයනෝරිස්ට වාර 2ක්ද හිමි විය. දැන් ඔවුන් දෙදෙනා වෙන් වී සිටින නිසා, අයනෝරිස්ටත් වාර 3ක් ලැබිය යුතුයි ඉල්ලා සිටී. දීසොන් සහ අයනෝරිස් අතර ඇති ආරාවුල මෙයයි. මේ ඉල්ලීම විපරීත එකක් නිසා මම එය ප්‍රතික්ෂේප කරමි. දීසොන්ට ඔහු ලත් වාර 3න් අයනෝරිස්ට ඔහු ලත් වාර 2න් පමණක් හිමි වෙනවා ඇත. අයනෝරිස්ට වැඩි වාර යක් ලැබේ නම් ඉන් දීසොන්ට හෝ අන් තුල් දැල් හිමියන්ට හෝ පාඩු විඳීමට සිදුවෙනු ඇත.

මෙම වරාය තුළ මාදැල් වට කිරීමට අවසර ඉල්ලා සිටි විල්බට් පියදාස එම අයිතිවාසිකම ඉල්ලා සිටීමට මා හමුවෙහි පෙණී සිටියේ නැත. ඔහුගේ ඉල්ලීම තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් හෝ ඉදිරිපත් කොට නොමැත. එම ඉල්ලීමට හේතු කිසිදු සාධාරණයක් මට නො පෙනෙන හෙයින් මම එයද ප්‍රතික්ෂේප කරමි.

සම්පිණ්ඩය :

මාදැල් හිමි කණ්ඩායම් තුන, සිරිවර්ධන නියෝගය අනුගමනය කරනු ඇත. එහෙත් දින 15 චක්‍රය වෙනුවට ඔවුන් පිළිපැදිය යුත්තේ දින 18 චක්‍රයකි. මේ කණ්ඩායම් වලට පහත දැක්වෙන අන්දමට වාර හිමිවෙනු ඇත :—

| | |
|---|---|
| දීසොන් | වාර 3යි |
| අයනෝරිස් | වාර 2යි |
| බාරොන් | වාර 3යි |
| මත්තොසිංඤෝ | වාර 1යි |
| ආරොන් | වාර 1යි |
| අන්තෝනි අන්දෝරිස් | වාර 3යි |
| අන්තෝනි ගිදිරික් | වාර 2යි |

මා විසින් ඉහතින් සඳහන් කළ කොන්දේසි උඩ, සංගමයට දින 18 චක්‍රයෙන් දින 3ක් පෙරසේම හිමිවෙනු ඇත.

මෙම වරායෙහි මාදැල් වට කිරීමේ කිසිම වාරයක් තෙල්වත්ත පැරැලිය මසුන් මරන්නන්ගේ සමුපකාර ණය ගණුදෙණු හා වෙළඳ සමිතිය සංවිධානය කළ මසුන් මරන්නන් කණ්ඩායමට හිමි නොවේ.

ගිදිරික් සිල්වා හා ඔහුගේ සොහොවුරු අන්තෝනි අන්දෝරිස් සිල්වා අතර ඇති ආරාවුල ගිදිරික් සිල්වා වැඩි වාරයක් ඉල්ලා සිටී මයි. සාක්ෂි සඳහා ඉදිරිපත් කළ ජී 2 දරන ලියවිල්ලෙන් එකඟ වූ ප්‍රකාර ඔහුගේ සොහොයුරු අන්දෝරිස් සිල්වාගේ වාරයන්ගෙන් 1ක් ගිදිරික් සිල්වාට හිමිවෙනවා ඇත.

දීසොන් සිල්වා සහ අයනෝරිස් සිල්වා අතර ඇති ආරාවුල නම් අයනෝරිස් වැඩි වාරයක් ඉල්ලා සිටීමයි. එහෙත් දීසොන් එය දීමට සූදානම් නොමැත. අයනෝරිස්ට වැඩි වාරයක් දීමට කිසිම හේතුවක් නොමැති. එහෙයින් අයනෝරිස් සිල්වාට හිමි වාර 2ත් දීසොන් සිල්වාට හිමි වාර 3ත් එලෙසම පවතිනවා ඇත.

තෙල්වත්ත වරාය තුළ මාදැල් වටකිරීමේ අවසර ඉල්ලා සිටි විල්බට් පියදාසගේ ඉල්ලීම ප්‍රතික්ෂෙප කරමි.

1960 අගෝස්තු 6 වැනිදා, විභාගය නිමවෙන අවස්ථාවේදී සියලුම පක්ෂ එකඟවී දැල් හිමියන් මාලු ඇල්ලූ අවස්ථාවේදී ඔවුන්ට හිමි කොටස සියයට 40 කිරීමටත්, ස්ථිර සේවකයන්ගේ කොටස සියයට 60 කිරීමටත් තීරණය කළහ. මෙය හැම වර්ගයකම දැල් කෙරෙහි බලපානවා ඇත. අනියම් සේවකයන්ට ගෙවා ඉවර වූ පසු මෙය බෙදනවා ඇත.

විභාගය නිම කිරීමෙහි දී, අගෝස්තු 6 වැනිදා නීතිඥයන් ඉදිරිපත් කළ අනිත් යෝජනාවන් සම්බන්ධයෙන් කියන්නට ඇත්තේ මේ යෝජනාවන් ක්‍රියාත්මක කළහොත්, එහි ප්‍රතිඵලය වනුයේ වැඩකල නොහැකි තත්ත්වයක් පැන නැගීමට ඉඩ ඇති බවය. වරාය මසුන් මැරීමේ සාමය ආරක්ෂා කර ගැනීමට නම් අන්‍ය දැල් හිමියන් යටතේ ස්ථිර සේවය කරන්නන් තමන් යටතේ සේවයට නො ගැනීමට තුල් දැල් හිමියන් හා අතිකුත් දැල් හිමියන් වටහා ගත යුතුයි.

මේ විභාගය සාමකාමීව, කරගෙන යාමට මට උදව් දී මෙහි මනා සංවිධානයක් ඇති කළ පොලිස් නිලධාරීන්ට හා ධීවර දෙපාර්තමේන්තුවේ සහ ආදායම් පාලක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, අන්තිම වශයෙන්, මම ස්තුති කරමි.

එස්. එස්. ජේ. ගුණසේකර,
සමථයට පමුණුවන නිලධාරී,
තෙල්වත්ත වරාය ධීවර ආරාවුල.

1960 අගෝස්තු 32.

10-399

---

## 1950 අංක 25 දරණ ආහාර පාලන පනත

### අංක 156 දරණ නියෝගය

මෙරට වගා කළ වියළි මිරිස් කිසියම් ප්‍රමාණයක් ආහාර පාලක විසින් හෝ කිසියම් පාලන දිස්ත්‍රික්කයක නියෝජ්‍ය ආහාර පාලක යෙකු විසින් ඒ සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව දිවයිනේ කිසියම් කොටසක සිට යාපනේ අර්ධද්වීපයට ප්‍රවාහණය කිරීම හෝ අන් අයුරකින් යැවීම වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම 1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) (i) වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, මෙයින් තහනම් කරමි.

මේ නියෝගය සඳහා "යාපනේ අර්ධද්වීපය" නමින් හැඟවෙන්නේ පූනකරී ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයද, කරච්චි-තුනුක්කුයි ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයද හැර යාපනේ පාලන දිස්ත්‍රික්කයයි.

1960. 8. 12 දින අංක 12,182 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 151 සහ 60.8.3 දින දරණ මගේ නියෝගය මෙයින් අවලංගු කරමි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1960 ඔක්තෝබර් 11 වෙනි දින,
කොළඹදී ය.

10-471

---

## 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥපනත

### නියෝගය

1947 සැප්තැම්බර් 24 වැනි දිනය හා 9,773 අංකය දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති තැන්පත් ටිකිරි බණ්ඩාර ඉලංගරත්න වන මම, මෙම නියෝගය මගින් 1960 සැප්තැම්බර් මස 23 වෙනි දිනය හා 12,205 අංකය දරණ ගැසට් පත්‍රයේ පළ කෙරුණු නියෝගයෙන් අන්තිම වරට සංශොධනය කරණ ලද ප්‍රකාර 1953 දෙසැම්බර් 11 වැනි දිනය හා 10,621 අංකය දරණ ගැසට් පත්‍රයේ පළ කළ නියෝගය ඊට යා කළ උපලේඛනයේ 1 වැනි තීරයේ අගට පහත දැක්වෙන කොටස ඇතුළත් කොට, සංශෝධනය කරමි :—

"ජෝන් පිලිප් ලෝරන්ස් පෙරේරා මහතා"

"විලියම් දේවසගායම් ඒබ්‍රහාම් මහතා"

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු
පිළිබඳ ඇමති.

1960.10.13 වැනි දින,
කොළඹ.

10-499

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

පහත පෙනෙන උපලේඛනයේ සඳහන් නියෝගය ම විසින් පිළිගනු ලැබූ බව 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4වෙනි වගන්තියේ 7 වෙනි අතුරු වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

1960 ඔක්තෝබර් 12 දින,
කොළඹදීය.

ඊ. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් ඇමතිතුමා.

### උපලේඛනය

| දිනය | නියෝගය දුන් බලධාරියා | නියෝගය බලපවත්වන ද්‍රව්‍ය | නියෝගය පලකළ ගැසට් පත්‍රය |
|---|---|---|---|
| 1960.9.7 | ... මාතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක | එළුමස් හා හරක් මස් | ... අංක 12,201 හා 1960.9.16 |

10–487

## විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

### රජයේ දුම්රිය සේවය

**දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම**

උතුරු දුම්රිය මාර්ගයේ කිලිනොච්චිය සහ පරන්තන් දුම්රිය පලවල් අතර හැ. 205 ද. 42 දරණ යාපනය-මහනුවර පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය වර්ෂ 1960 ඔක්තෝබර් මස 22 වෙනි සෙනසුරාද සවස 5.30 සිට පසු දින ඉරිදා උදය 10 දක්වා අළුත්වැඩියා කරණ හෙයින් සෙනසුරාද රාත්‍රි 10 යේ සිට පසු දින ඉරිදා උදය 4 දක්වා රථවාහන ගමනාගමනයට සම්පූර්ණයෙන් වසා තබනු ලැබේ.

මෙම කාලය තුළදී රථවාහන හැ. 206 ද. 12 දරණ ස්ථානයේ (කරඩි පෝක්කු) හරස් පාරෙන් ගමන් කරවනවා ඇත.

10-585